**පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ් - 2022/ 2023**

------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ් ("සමාගම") හි 2023 මාර්තු 31 දිනට දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහය මා ලබා ගන්නා ලදී.

සමාගමේ 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින්ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනා කරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තා කරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා සමාගම විසින් පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම් කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශන වල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සමාගමේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැළසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායි ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව සමාගම කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීති වලට අනුකූලව සමාගම ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සම්බන්ධ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ස්ථාවර තැන්පතු සහ ඉතුරුම් තැන්පතු වලින් ලැබෙන පොලී ආදායම යන දෙකම ස්ථාවර තැන්පතු වලින් ලැබෙන පොලී ආදායම යටතේ වර්ග කර ඇත. | පෙන්වා දුන් කරුණ පිළිබඳව හඳුනාගන්නා ලදී. 2023/24 ඔක්තෝබර් මාසයේ සිට ස්ථාවර තැන්පතු සහ ඉතුරුම් තැන්පතු වලින් ලැබෙන පොලී ආදායම වර්ගීකරණය කර 2023/24 මූල්‍ය වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල, පැහැදිලිව ඉදිරිපත් කෙරේ. | වර්ගීකරණයේ නිරවද්‍යතාවය තහවුරු කිරීම සඳහා පොලී ආදායම වෙනම හඳුනාගත යුතු වේ. |
| (ii) | තොග ශේෂය තුල රු. 899,903 ක් වූ චලනය නොවන අයිතම (අමතර කොටස්) අන්තර්ගතව ඇති අතර බාහිර ගනුදෙනු කරුවන්ට අමතර කොටස් අලෙවිය සිදු නොකරන බැවින් මෙම තොගයේ වටිනාකම පිරිවැයට අගය කර ඇත. | පෙන්වා දුන් කරුණ පිළිබඳව හඳුනාගන්නා ලදී. තොග බැහැර කිරීම සඳහා වන යෝජනාවක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය මත ඉදිරි ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කෙරේ. | මූල්‍ය ප්‍රකාශනවල නිරවද්‍යතාවය සහතික කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) පහත සඳහන් ණය ගැතියන් සම්බන්ධයෙන් දිගු කාලීන හිඟ ශේෂයන් වාර්තා විය.<br>පොදු ලෙජර කේතය / ණයගැතියන් / ශේෂය (රු.)<br>1304990210 / නඩත්තු වියදම් - වෙනත් සමාගම් වාහනය / 280,052<br>PMPLC / ණයගැතියෝ -පීපල්ස් මර්චන්ට් පී.එල්.සී / 419,373<br>1304990022 / ණයගැතියෝ -පීපල්ස් ලීසිං මූල්‍ය සමාගම / 776,568 | පෙන්වා දුන් කරුණ පිළිබඳව හඳුනාගන්නා ලදී. මූල්‍ය ප්‍රකාශන වල ප්‍රමාණවත් වෙන්කිරීම් සිදු කර ඇත. කළමනාකාරීත්වයේ තක්සේරුව 2023/24 මූල්‍ය වර්ෂයේදී ලැබීමෙන් පසු අය කර ගැනීමට ඇති ඉදිරි පියවර ගනු ඇති අතර අවශ්‍ය මූල්‍ය ගැලපීම් සිදු කරනු ඇත. | ණය ගැතියන්ගේ අයකර ගැනීමේ හැකියාව නැවත තක්සේරු කිරීම හා අදාළ ශේෂයන් අයකර ගැනීමට පියවර ගැනීම අවශ්‍ය වේ. |
| **(ii)** 2022 මාර්තු 31 දිනට ඉහත ශේෂවලින් රු. 419,373ක් සහ රු. 280,052ක් නොපියවී තිබුණි. | | |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 56,196,435 ක බදු පෙර ලාභයක් වූ අතර පෙර වසරේ අනුරූප ලාභය රු. 200,405,595 කි. ඒ අනුව පෙර වර්ෂයට සාපේක්ෂව රු. 144,209,160 කින් බදු පෙර ලාභය අවප්‍රමාණය වීමක් නිරීක්ෂණය කරන ලදී. මූල්‍ය ආදායම රු. 50,377,872 කින් ඉහළ ගොස් පැවතිය ද ආදායම රු.100,975,543 කින් හා අනෙකුත් ආදායම රු. 115,715,129 කින් අඩු වීම මෙම අවප්‍රමාණය සඳහා හේතු වී ඇත.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමවල ප්‍රවණතා විශ්ලේෂණය

**2.2.1** සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ හතරක සමාගමේ මූල්‍ය ප්‍රතිඵල සාරාංශ කර පහත වගුවේ දැක්වේ.

| වර්ෂය | 2022/2023 | 2021/2022 | 2020/2021 | 2019/2020 | 2018/2019 |
|---|---|---|---|---|---|
| ආදායම (රු.) | 66,011,987 | 166,987,530 | 192,948,002 | 231,749,158 | 225,594,044 |
| ඉකුත් වර්ෂයට සාපේක්ෂව වැඩිවීම / (අඩුවීම) (%) | (60.47) | (13.45) | (16.74) | 2.73 | |
| සේවා පිරිවැය (රු.) | 83,389,236 | 91,198,567 | 119,545,609 | 128,070,821 | 124,034,050 |
| ඉකුත් වර්ෂයට සාපේක්ෂව වැඩිවීම / (අඩුවීම) (%) | (8.56) | (23.71) | (6.66) | 3.25 | |
| බදු පෙර ලාභය (රු.) | 56,196,435 | 200,405,595 | 55,652,020 | 32,559,436 | 47,137,636 |
| ඉකුත් වර්ෂයට සාපේක්ෂව වැඩිවීම / (අඩුවීම) (%) | (71.96) | 260.10 | 70.92 | (30.93) | |

**2.2.2** සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමවල විශ්ලේෂණයක් පසුගිය වර්ෂය සමඟ සසඳා වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතයන් සහිතව පහත වගුවේ දැක්වේ .

| විස්තරය | විචලනය වැඩිවීම / (අඩු වීම) (රු.) | විචලනය % | විචලනය සඳහා හේතුව |
|---|---|---|---|
| ආදායම | (100,975,543) | (60.47) | පවතින අහිතකර ආර්ථික තත්ත්වයන් හේතුවෙන් තක්සේරු ආදායම් අඩුවීම සහ ව්‍යාපාර ප්‍රමාණය අඩු කිරීමේ උපාය මාර්ගය හේතුවෙන් මෙහෙයුම් ආදායම් අඩුවීම. |
| වෙනත් ආදායම් | (115,715,129) | (66.48) | වාහන බැහැර කිරීමේ ලාභය වෙනත් ආදායම් තුළින් නිරූපණය වේ. පසුගිය වසරේ වාහන 29ක් විකුණා ඇති අතර වත්මන් මූල්‍ය වර්ෂයේදී වාහන 10ක් පමණක් විකුණා ඇත. |

| | | | |
|---|---|---|---|
| මූල්‍ය ආදායම් | 50,377,872 | 312.73 | මූල්‍ය ආදායම ඉහළ යාම සඳහා කරුණු දෙකක් බලපා ඇත.වාහන විකිණීම මඟින් ලබා ගන්නා අරමුදල් උපයෝජනය කරමින් සිදු කරන ලද නව කෙටිකාලීන ආයෝජනයන් හා කෙටිකාලීන ආයෝජනයන්ගේ පොදු අනුපාත ඉහළ යාම හේතුවෙන් 2022 මූල්‍ය වර්ෂයේ සාමාන්‍ය වාර්ෂික පොලී ඉපැයුම 6.7 සිට 2023 මූල්‍ය වර්ෂයේ 17.3 දක්වා වැඩි වී ඇත. |
| පරිපාලන වියදම් | (11,458,013) | (18.80) | සේවක ප්‍රසාද දීමනා, මුද්‍රණ සහ කුලී වියදම් අඩු වීම. |

**2.3 අනුපාත විශ්ලේෂණය**

ලබාගත හැකි වූ තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂයේ සමාගමේ වැදගත් අනුපාත, පහත වගුවේ දැක්වේ.

| **විස්තරය** | **2022/23** | **2021/22** |
|---|---|---|
| දළ ලාභ අනුපාතය | (26.32%) | 45.39% |
| ශුද්ධ ලාභ අනුපාතය | 59.37% | 91.93% |
| හිමිකම මත ප්‍රතිලාභය (ROE) | 11.23% | 39.79% |
| වත්කම් මත ප්‍රතිලාභය (ROA) | 8.82% | 34.49% |
| ණය හිමිකමට අනුපාතය | 0.27 | 0.15 |
| ජංගම අනුපාතය | 4.89 | 8.31 |